SC

# සාංඛ්‍ය දර්ශනයේ එන පංචවිංශති තත්ත්වයන්

# හා

# බෞද්ධ නාම-රූප ධර්මයන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
23 MAR 2010
UNIVERSITY OF KELANIYA

වලපනේ ඤාණසේන හිමි
FGS / 04 / 02 / 07 / 2001 / 02

දර්ශනපති උපාධිය

සංස්කෘත අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

2009 අගෝස්තු



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 587 |
| වර්ග අංකය | |

## උපන්‍යාසය

භාරත දේශය වනාහි දර්ශනවාදයන්ගෙන් ගහන වූ දෘෂ්ටි ජාලයකි. දීඝනිකායාගත බ්‍රහ්මජාල සූත්‍රයට අනුව බුද්ධෝත්පාද කාලය වන විට දෘෂ්ටි හෙවත් දර්ශනවාද සැට දෙකක් තරම් වූ බව පැහැදිලි වෙයි. එකී දර්ශනවාදයනට පූර්වයෙන්, එනම් ප්‍රාග් බෞද්ධ යුගයෙහි දී ආරම්භ වන්නට ඇතැයි නිගමනය කෙරෙන සාංඛ්‍ය දර්ශනය සෙසු දර්ශනවාදයන් අභිබවා ඉදිරියෙන් සිටී. විශ්වයත් එහි නිර්මාණයත් පිළිබඳ බුද්ධිමත් ව කල්පනා කර සැකසී ගත් දර්ශනයක් වීම ඊට හේතුව යි. ඉන්දියානු දර්ශනවාද (න්‍යාය - වෛශේෂික, යෝග, මීමාංසා, වේදාන්ත) සියල්ලක් ම පාහේ ගත් මග නොගොස් තමන්ට ම ආවේනික වූ ක්‍රමවේදයකින් විශ්වය විග්‍රහ කිරීම හේතු කොට ගෙන සාංඛ්‍ය දර්ශනයේ වටිනාකම තවත් තීව්‍ර කර තිබේ.

සාංඛ්‍යයෝ "එකමෙවාද්විතීයම්" යන උපනිෂද් මහාවාක්‍ය නො පිළිගත්හ. එහෙයින් විශ්වය මූල හේතු දෙකකින් ප්‍රභවය වූ සේ දක්වන ඔවුහු ගතානුගතිකත්වයෙන් මිදී ස්වෛරී වූ ගමන් මගක් තෝරා ගත්හ. ඒ ස්වාධීන පදනම මත නැගී සිටි ඔවුහු දෙවැන්නෙක් නැති එකමැ යි යන එකී මතය ප්‍රතික්ෂේප කළහ. විෂය විෂයීන් දෙදෙනා අතර පවත්නා පැහැදිලි වෙනස සැලකිල්ලට ගනිමින් වෛශ්වීය මූල තත්ත්වය එකක් නොව දෙකකැ යි ප්‍රකාශ කළහ. විශ්වය පිළිබඳ භෞතික මූල හේතුව වන (Material Cause) ප්‍රකෘතිය හා විඥානමය මූල හේතුව වන (Intelligent Cause) පුරුෂයත් එකී ද්වෛතය යි. මෙසේ අතිශයින් ගැඹුරු දාර්ශනික සංකල්ප දෙකක් පිළිබඳ පරතෙරට කල්පනා කර එළඹ ගත් නිගමන මෙම දර්ශනය හරහා විෂය ලෝකයට පිවිස තිබේ.

සාංඛ්‍යයන් ගේ ප්‍රකෘති පදාර්ථය මුළුමනින් ම භෞතික ය. අන්ධ ය. එහි සංයුතිය වන සත්ත්ව, රජස් හා තමස් යන ගුණ විශ්වාරම්භයට පෙර සාම්‍යාවස්ථාවෙහි පවතියි. පුරුෂ ගේ නිරීක්ෂණය ප්‍රකෘති කෙරෙහි යොමු වූ විට ප්‍රකෘති විශ්ව පරිණාම ක්‍රියාවලිය

ආරම්භ කරයි. මුලින් ම ප්‍රකෘතිගෙන් පරිණාමය වන්නේ "මහත්" නොහොත් බුද්ධිය යි. බුද්ධියෙන් අහංකාරය ද අහංකාරයෙන් එකාදශ ඉන්ද්‍රියයන් සහ පංචතන්මාත්‍ර ද ඇති වේ. පංචතන්මාත්‍රයන් ගෙන් පංච මහා භූත ප්‍රභවය වේ. මේ ක්‍රියාවලිය භෞතික මූල හේතුවක් විශ්වය දක්වා විකාශනය වීමකි. එහෙත් එය පරමාණූන් ගේ අන්ධ යාන්ත්‍රිකත්වය නිසා බිහි වන්නක් නොව පුරුෂ ගේ විඥානය විසින් මෙහෙයවනු ලැබ සිදු වන්නක් නිසා මෙම දර්ශනය මාක්ස්වාදය මෙන් කේවල භෞතිකවාදයක් නො වේ. ප්‍රකෘති ගේ ගුණයන් වන සත්ත්ව, රජස්, තමස් යන මේවා එක් අතකින් ද්‍රව්‍යාත්මක ය. අනෙක් අතින් ලෝභ, ද්වේෂ, මෝහ වැනි මානසික තත්ත්වයන් ඇති වීමට ද හේතු වේ. විශ්වය විඥප්තිමාත්‍රයක් යැ යි පවසන ආත්මීය විඥානවාදයෙන්, (Subjective Idealism) මේ නිසා සාංඛ්‍ය දර්ශනය වෙනස් වේ. ඒ අනුව අන්තගාමී ප්‍රතිපදාවන් ප්‍රතික්ෂේප කරන සාංඛ්‍යයෝ මධ්‍යම මාවතක ගමන් කරනු පෙනේ. ලෝකයේ ඇත්තේ විඥානය පමණකි, ද්‍රව්‍යය යනු මායාවකි, යන ඒකාන්ත විඥානවාදී මතය ද, ලෝකයෙහි පවත්නේ භෞතික තත්ත්ව පමණකි, විඥානය භෞතිකයේ ම ක්‍රියාකාරිත්වයකි, යන ඒකාන්ත භෞතිකවාදී ඉගැන්වීම ද දර්ශනයේ ආරම්භයෙහි පටන් අද දක්වා ම නිරන්තර සාකච්ඡාවට භාජනය වන ගැටළුවක් වී තිබේ.

විශ්වයේ පවත්නා සත්තාව පරමාණු ස්වරූපයේ ද්‍රව්‍යයෙන් ම තැනුනකි, යනුවෙන් චාර්වාකයෝ පවසති. මාක්ස්වාදීන් ගේ පිළිගැනීම ද එය යි. විඥප්තිය යනු මේ භෞතිකයෙහි ම ක්‍රියාකාරිත්වය නිසා පැන නගින්නකි. චාර්වාකයන් ගේ නිගමනයට අනුව පවත්නේ සතර මහා භූතයන් පමණි. ඒවායෙහි ක්‍රියාකාරිත්වය නිසා මනසක් ඇති සේ පෙනේ. මෙය වාෂ්ප යන්ත්‍රයක නලාව වැනිය. වාෂ්පය ඉපියාවක් තුළින් ගමන් කිරීමෙන් ඒ නලා හඬ නැගේ. ඇත්තෙන් ම නලාව යැ යි අමුතු දෙයක් නැත. ඇත්තේ වාෂ්පයේ ක්‍රියාකාරිත්වයකි. නො එසේ නම් බුලත් විටෙහි රතු පැහැය වැනිය. බුලත්, පුවක්, හුණු යන මේ කිසිවක් හි රතු පැහැය නැත. එහෙත් ඒවා එකට හැපීමෙන් රතු පැහැයක් ගනී. සතර මහා භූතයන් ගේ ක්‍රියාවලියෙහි එසේ ම මනසක් ඇති සේ පෙනේ.

ආත්මීය විඥානවාදීන් ගේ ඉගැන්වීමට (Subjective Idealism) අනුව විශ්වයේ ඇත්තේ විඥානය පමණි. විඥාන ප්‍රවාහයක් විසින් උඩට මතු කර දක්වන වස්තුවක් ඇති සේ අපට පෙනේ. ජල ප්‍රවාහයක් විසින් උඩට විසි කරන පෙන බිංදුවක් මෙන් විෂය වස්තූන් ගේ පැවැත්ම සිදු වේ. ඒවාට ස්වෛරී පැවැත්මක් නැත. යෝගාචාර විඥානවාදය යථෝක්ත මතය පිළිගත් බෞද්ධ සම්ප්‍රදායකි. සියල්ල ඊශ්වර ගේ විඥානයෙහි පවතියි. ඊශ්වර විසින් ඉන්ද්‍රජාලිකයෙකු මෙන් මවා පෙන්වන දෙය අපි දකිමු. භෞතිකයට ස්ථිර පැවැත්මක් නැත. භෞතික වස්තූන් මායා හැටියට ශංකර දක්වයි. මෙසේ වාස්තවික විඥානවාදයට අනුව ද භෞතිකයට යථාර්ථවත් පැවැත්මක් නැත. සාංඛ්‍යයන් ගේ ඉගැන්වීමට අනුව විඥානය සහ ද්‍රව්‍ය යන දෙක ම යථාර්ථවත් ව පවතියි. ප්‍රකෘති භෞතිකය යි. පුරුෂ විඥානය යි. නැතහොත් එහි පසුබිම යි. මේ දෙකේ සම්බන්ධයෙන් විශ්වයේ පරිණාමය සිදු වේ. විශ්වයේ පවත්නා සත්තාවන් හැටියට පංචවිංශති තත්ත්වයන් යථාර්ථවත් ව පවත්නා බව මෙහි දී කියැවේ. බෞද්ධ දර්ශනය ද ආභිධර්මික ව චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යන පරමාර්ථ ධර්ම හතරක් පවතින බව කියයි. මේවායේ අන්තර්ගතය විවිධ ප්‍රභේදයනට අනුව කොටස් කර ඇත. කෙසේ මුත් බෞද්ධ දර්ශනය සාංඛ්‍ය දර්ශනය හා සම්බන්ධයෙන් බොහෝ දුරට සමාන මාවතක ගමන් කරයි. එසේ ද වුවත් ප්‍රකෘති වැනි ගූඪ හේතුවක් පිළිබඳ ව බෞද්ධ දර්ශනය කිසිත් නො පවසයි. බුද්ධ ධර්මයට අනුව සංසාරයෙහි පූර්ව හේතුවක් දැකිය නො හැකි ය. එසේ ම අවිනශ්වර ආත්මයක් ලෙසින් පවතින පුරුෂ පදාර්ථය වැන්නක් බෞද්ධ ඉගැන්වීම් තුළ නැත. ඇත්තේ වෙනස් වන චිත්ත ප්‍රවාහයක් පමණි. එසේ ද වුවත් බෞද්ධ නාම - රූප ධර්ම සමඟ සාංඛ්‍ය දර්ශනයෙහි ඉගැන්වෙන පස් විසි තත්ත්වයන් අතිශයින් සාදෘශ්‍යයක් දක්වයි. එසේ ම විසදෘශතා ද ඇත. බෞද්ධයන් විසින් නාම ධර්ම සේ ගැනෙන්නක් සාංඛ්‍යයෝ රූප ධර්ම සේ ගනිති. විටෙක බෞද්ධ ධර්මයේ එන රූප ධර්ම සාංඛ්‍යයන් නාම ධර්ම ලෙස හඳුනාගෙන තිබේ. මේ සම්බන්ධයෙන් අන්තවාදී වූ භෞතිකවාදී හා විඥානවාදී දර්ශනයන් මෙන් නොව විඥානමය හා භෞතිකමය යන දෙයාකාර

(ශ්‍රී ලංකාව)

සත්තාවන් වටහා ගැනීම අතින් සාංඛ්‍ය - බෞද්ධ උභය දර්ශනයන් දක්වන ස්ථාවරය පිළිබඳ ගවේෂණය කාලෝචිත වූවක් බව මෙහිදී පැහැදිලි වනු ඇත. විශේෂයෙන් ම බුද්ධි විකාශනයේ ආරම්භයේ සිට මිනිස් මනස වෙහෙසට පත් කළ වස්තු මීමාංසක ගැටළුව (Ontological Problem) විසඳාගැනීමෙහි ක්‍රමෝපායයන් හා එහි ලා ප්‍රායෝගිකත්වය මෙම පර්යේෂණය තුළින් සිදූ කරනු ලැබ තිබේ.